# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.14 පැය 0645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1755/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. බලපත්‍ර නොමැතිව මෙරටට ආනයනය කරන ලද මෝටර් රථ දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය.

2025.09.13 වන දින උදෑසන කාලයේ මැණික්හින්න පොලිස් වසමේදී හා වත්තේගම පොලිස් වසමේදී කොළඹ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර බලපත්‍ර නොමැතිව විදෙස් රටවල සිට නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මෙරටට ආනයනය කර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ දත්ත පද්ධතියට ව්‍යාජ දත්ත ඇතුලත් කරන ලද ජීප් රථ දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 58 වයස්වල පසුවන මැණික්හින්න හා වත්තේගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් 2025.09.13 වන දින තෙල්දෙණිය ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.09.15 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. කොළඹ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය මගින් වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 02. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කරණ්දෙනිය පොලිස් වසම.

2025.09.11 වන දින කරණ්දෙනිය පොලිස් වසමේ කැබැල්ලගොඩ ප්‍රදේශයේදී කාන්තාවකට හා පිරිමි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් කරණ්දෙනිය පොලිස් ස්ථානය මගින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව කරණ්දෙනිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2025.09.13 වන දින සවස් කාලයේදී කොටවිල ප්‍රදේශයේදී අපරාධය සිදු කල සැකකරු මෙරට නිෂ්පාදිත අත් බෝම්බයක් සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 44ක් වන කොටවිල,කරණ්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කරණ්දෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. කුෂ් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.

2025.09.13 වන දින දහවල් කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කරන ලද වැටලීමකදී කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 08 ග්‍රෑම් 542 ක් සන්තකයේ තබා ගෙන සිටි විදේශ ජාතික සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ඉන්දීය ජාතිකයෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. ගංජා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මරදන්කඩවල පොලිස් ස්ථානය.

2025.09.13 වන දින දහවල් කාලයේ මරදන්කඩවල පොලිස් වසමේ කසාගල පාර ප්‍රදේශයේදී මරදන්කඩවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර ගංජා කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 10 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන මරදන්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදන්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වැලිගම පොලිස් වසම.

2025.09.13 වන දින සවස් කාලයේ වැලිගම පොලිස් වසමේ වැලිගම අකුරැස්ස මාර්ගයේ දෙනිපිටිය හන්දිය ආසන්නයේදී වැලිගම දෙස සිට අකුරැස්ස දෙසට ධාවනය වූ ලොරි රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකාරිය බරපතල තුවාල ලබා වලාන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 33 ක් වූ නිදංගල, දෙනිපිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වලාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**